සැ.යු : 2020.04.03 අංක 2170, 2020.04.09 අංක 2171, 2020.04.17 අංක 2172, 2020.04.24 අංක 2173, 2020.04.30 අංක 2174, 2020.05.06 අංක 2175, 2020.05.15 අංක 2176 සහ 2020.05.22 අංක 2177 යන ගැසට් පත්‍ර පළ නොවූ බව දන්වා සිටිමි. (COVID - 19 වසංගත තත්වය හේතුවෙනි)

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,178 - 2020 මැයි මස 29 වැනි සිකුරාදා - 2020.05.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 428 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 428 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | — |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2020 ජුනි මස 19 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 ජුනි මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය.''*

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


427 – B 82025 — 403 (2020/05)
A 1-

**විශේෂ නිවේදනයයි**

Covid - 19 වසංගත තත්ත්වය හේතුවෙන් රට තුළ ක්‍රියාත්මක නිරෝධායන කටයුතු නිසා 2020.03.16 දින සිට 2020.05.11 දින දක්වා රාජ්‍ය හා පෞද්ගලික ආයතන විවෘත කර නොතිබූ බැවින් රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා කිසිදු නිවේදනයක් රජයේ මුද්‍රණාලයට නොලැබුණි.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

MOD/DEF/HRM/SLN/COM.

සංශෝධනයයි

2020 මාර්තු මස 06 වන දින පළකරන ලද අංක 03-20/34 හා 2020 අංක 128 දරන නිවේදනයෙහි පළමු නමෙහි නිල අංකය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුය :

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම

*2019 ඔක්තෝබර් මස 03 වැනි දින සිට වැඩබලන උප ලුතිනන් (ස්වේච්ඡා) වශයෙන් :*

උඩගම විජේතුංග ආරච්චිගේ තරුදිනී අවිහිංසා විජේතුංග, එන්වීඑක්ස් 5878, ශ්‍රීලංස්වේනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී
යූඑස්පී එන්ඩීසී පීඑස්සී,
මේජර් ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2020 ජනවාරි මස 06 වැනි දින,
කොළඹ දී ය.

05 - 11

# රජයේ නිවේදන

**ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**

2002 අංක 17 දරන මැනුම් පනත

**27 වන වගන්තිය යටතේ ඉඩම් මැනුම් සභාවේ සාමාජිකයින් පත් කිරීම**

2002 අංක 17 දරන මැනුම් පනතේ 27 (අ) වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව ඉඩම් මැනුම් සභාවේ සාමාජිකයින් පත් කරමින් 2020.02.14 දිනැති අංක 2163 සහ 2020.03.03 දිනැති අංක 2166 දරන ගැසට් පත්‍රවල පළකරන ලද නිවේදන පහත සඳහන් ලෙස 2020.02.26 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සංශෝධනය කරමි.

(අ) නිල බලයෙන් සාමාජිකයින් වන තැනැත්තන්,

I. අඹවල ලියනගේ ශ්‍යාමලී චිත්‍රලේඛා පෙරේරා - සර්වේයර් ජනරාල් - සභාපති - 2020.02.26 වැනි දින සිට සර්වේයර් ජනරාල් ධුරයේ රැඳී සිටින කාලය දක්වා

II. විජේරත්න තෙන්නකෝන් මුදියන්සේලාගේ සිසිර බණ්ඩාර තෙන්නකෝන් - අතිරේක සර්වේයර් ජනරාල් - උප සභාපති - 2020.02.26 වැනි දින සිට අතිරේක සර්වේයර් ජනරාල් ධුරයේ රැඳී සිටින කාලය දක්වා.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

වර්ෂ 2020 ක් වූ මැයි මස 20 වැනි දින,
කොළඹ දී ය.

05 - 47

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.